**GMOA**

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2013/10/31

## මාධ්‍ය නිවේදනයයි

වෛද්‍ය නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව තුලින් දැනට පවතින උසස්වීම් පටිපාටියේ කාල සීමාව 2006/06 චක්‍ර ලේඛණය අනුව වැඩි දියුණු කිරිමට අවශ්‍ය කරන ආයතන හතරෙහිම නිර්දේශ ලබා දී දැනට වසර දෙකක් ගතවී ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිලධාරිනියක් එම ඉදිරිපත් කල ආකෘතිය වැරදි බව පවසමින් දෙවරක්ම එය නිශ්ප්‍රභා කරන ලදි. ඉන්පසු අවස්ථා ගණනාවකදී විවිධ කරුණු පැහැදිලි කිරීම් යැයි පවසමින් කල් ගන්නා ලදි. පැහැදිලි කිරීම් වල මූලික ආචාර ධර්මවල සියලුම පැහැදිලි කිරීම් එක වරකින් සිදු කල යුතු වුවත් එම ආචාර ධර්ම වලට පටහැනි වෙමින් එකක් පසුපස එකක් පැහැදිලි කිරීම් ඉල්ලීම් ප්‍රමාද කිරීමේ උපක්‍රමයක් බව අප පෙන්වා දෙමු.

අවශ්‍ය නිර්දේශ ලබා දුන් විට ස්වාධීන කොමිෂමේ නිලධාරිවාදය තුලින් එය බාධා කිරිම අවාසනාවන්ත මෙන්ම අසාධාරන තත්ත්වයකි. ඒ බව සෞඛ්‍ය ඇමතිතුමාත් සෞඛ්‍ය ලේකම්තුමාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලිපියක් යවමින් අප ස්ථාවරය නිවැරදි බව දන්වා ඇත. අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට මෙම කාරණය යොමු වූ අතර එය විසදිමට මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පි.බි ජයසුන්දර මහතාට පවරන ලදි. ඒ අනුව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය 2013/10/30 දින ප.ව 2.30ට මහාභාණ්ඩාගාරයේ ලේකම්තුමා සමග සාකච්ජාකර පහත තිරණයන් ගන්නා ලදි.

1. වෛද්‍යවරුන්ගේ ඉල්ලිම සාධාරන බව අමාත්‍යාංශ 04 පමණක් නොව ජනාධිපතිතුමාද එකඟ වී ඇති බැවි දන්වන ලදි. එබැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෛද්‍ය සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටෙන ආකාරයෙන් නිලධාරිවාදයක් පවත්වාගෙන යන්නේ නම් විකල්ප ක්‍රම මගින් මෙම කාරණය විසදිමට ඉදිරි සති 06 තුලදි ක්‍රියා කරන බවට එකග වන ලදි. වෘත්තියවේදින්ට ආවේනික කරුණු පරිපාලකයින්ට තේරුම් ගැනිමට ඇති නොහැකියාව නිසා වෛද්‍යවරුන්ගේ සේවා බිඳවැටීමට නොදී නව ප්‍රතිපත්ති සැලසුමකින් ඉටුකරන බව දැන්විය.
2. අනිකුත් විවිධ පාර්ශව වලට නිවාස යෝජනා ක්‍රම ලබා දී ඇතත් බුද්ධි ගලනයට අසු නොවී රාජ්‍ය සේවයේ රැදුනු වෛද්‍යවරුන්ට නිවාස ලබා දිමට යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වී නැත. ඒ සඳහා අය වැය තුලින් අවශ්‍ය පියවර ගන්නා බවට ලේකම්තුමා එකග විය.
3. විදේශ පුහුණුවට යන වෛද්‍යවරුන්ගේ දිමනා සංශෝධනය කරන ලදි.
4. පශ්චාත් වෛද්‍ය උපාධි පාඨමාලා වැඩි දියුණු කිරිමට වෛද්‍යවරු විදේශගත කර රටට විදේශ මුදල් ඉපයිමට අප යෝජනා කර ඇති මෙම වැඩ පිලිවෙල මෙවර අය වැය යෝජනා තුලින් ඉටු කිරිමට අවශ්‍ය පියවර ගනු ඇත.
5. වෛද්‍ය නිලධාරීන්ට ලබා දෙන දිමනා යථාවත් කිරිම හා එම දිමනා අඛණ්ඩව ලබා ගැනිමට ඇති ගැටලු විසදිමට අවශ්‍ය පියවර අය වැය යෝජනා වලට ඇතුලත් කිරිමටද තිරණය විය.
6. දැනට පවතින 1:4 වැටුප් අනුපාත 1:12 දක්වා වැඩි කිරිම සඳහා නව ජාතික වැටුප් කොමිෂමක් මෙවර අය වැයට පෙර ස්ථාපිත කර නව ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සම්පාදනය කිරිමට පියවර ගැනිමට ද එකග විය.

යථෝක්ත සාකච්ජාවේදි එළඹුනු එකගතාවයන් පිලිබඳව අද දින (2013/10/31) විධායක කමිටුවේදි සාකච්ජා කල අතර එහිදි නොවැම්බර් 04 වන දින පැවැත්විමට යෝජිත වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය තාවකාලිකව අත්හිටුවීමට තිරණය විය.

ස්තූතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර - | වෛද්‍ය නලින් ආරියරත්න | - 0714800942 |
| | වෛද්‍ය නවීන් සොයිසා | - 0718582444 |
| | වෛද්‍ය නලින්ද හේරත් | - 0717876516 |